# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2091/48 – 2018 ඔක්තෝබර් 03 වැනි බදාදා – 2018.10.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/10/86/2013.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඒ. ඩී. ජයසිංහ මයා, අංක 735, සුදර්ශන මාවත, හිඹුටුවැල්ගොඩ, කැළණිය.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක 15, රොක්හවුස් පටුමග, කොළඹ 15.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්


1A – G28653 – 17 (2018/10)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මහනුවර, හෙද පුහුණු විදුහල, විදුහල්පති නිල නිවස, එල්. ආර්. සුමතිපාල මයා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2018 සැප්තැම්බර් මස 12 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/10/86/2013.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඒ. ඩී. ජයසිංහ මයා, අංක 735, සුදර්ශන මාවත, හිඹුටුවැල්ගොඩ, කැළණිය.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක. 15, රොක්හවුස් පටුමග, කොළඹ 15.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,

''ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ සැපයුම් නිලධාරියෙකු ලෙස සේවය කළ ඒ. ඩී. ජයසිංහ මහතා හට 2005.04.01 දින සිට ලබා දීමට නියමිතව තිබූ වැටුප් වර්ධක 4 ක් හා ඊට අදාළ හිඟ මුදල් ලබා නොදීම සහ ජ්‍යෙෂ්ඨ සැපයුම් නිලධාරී හා සැපයුම් කළමනාකරු යන තනතුරු වලට අදාළ උසස්වීම් ලබා නොදීම යුක්තිසහගතද? එසේ නොවන්නේ නම් ඒ. ඩී. ජයසිංහ මහතාට හිමිවිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.''

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 අගෝස්තු මස 28 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

10-920

---

මගේ අංකය: IR/COM//05/2016/140.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

අන්තර් සමාගම් සේවක සංගමය, අංක 259/9 සෙත්සිරි මාවත, කොස්වත්ත, තලංගම (සේවකයන් 20 දෙනෙකු වෙනුවෙන්)

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා හඳබිම අධිකාරිය, තැ.පෙ. 09, ගන්නෝරුව, පේරාදෙනිය.

අතර කාර්මික ආරවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවින්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්,

කටුගස්තොට, ගොහාගොඩ පාර, අංක 599, එච්. එම්. අනුලාවතී මෙනවිය පත් කර ඇය වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2018 සැප්තැම්බර් මස 20 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/05/2016/140.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

අන්තර් සමාගම් සේවක සංගමය, අංක 259/9 සෙත්සිරි මාවත, කොස්වත්ත, තලංගම (සේවකයන් 20 දෙනෙකු වෙනුවෙන්)

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා හඳබිම අධිකාරිය, තැ.පෙ. 09, ගන්නෝරුව, පේරාදෙනිය.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ,

''ශ්‍රී ලංකා හඳබිම අධිකාරියේ දීර්ඝ කාලයක් සේවයේ නියුතු එස්. ටී. රත්නකුමාර ඇතුළු පහත නම් සඳහන් සේවකයින් 20 දෙනා ස්ථිර නොකිරීමෙන් අසාධාරණයක් සිදුව තිබේද යන්න හා එසේ සිදුව තිබේ නම් හිමි විය යුතු සහන මොනවාද? හිමිවිය යුතු වැටුප කුමක්ද? යන්න පිළිබඳව වේ.''

01. එස්. ටී. රත්නකුමාර
02. ආර්. එන්. ඩී. ටී. ඩබ්. ආර්. එච්. එම්. ඒ. යටවර
03. ඕ. ජී. අනුෂා උදයංගනී කුමාරි
04. ඩබ්. ඩී. චන්ද්‍රරත්න
05. එස්. ටී. සී. එස්. කුමාර
06. එස්. ඒ. එන්. අසෝකා
07. ඩබ්. එම්. යූ. සී. ජී. සී. කේ. වික්‍රමසිංහ
08. එන්. ටී. එම්. ඉන්ද්‍රානි ඒකනායක
09. එච්. එම්. එච්. ඒ. සන්දිලිගම
10. එච්. ඒ. ආර්. කංකානම්ගේ
11. ආර්. ඒ. එරන්දිකා ඉන්දුමතී රණසිංහ
12. සී. ඒ. ජී. එස්. කුමාර
13. වයි. එම්. සී. ඩී. ඒකනායක
14. එන්. එච්. ධනුෂ්ක චන්දිමාල් මධුරංග
15. ඒ. ඒ. පී. ලීපගේ
16. එච්. ජී. රසිකා ප්‍රියංගනී කුමාරි
17. පී. ජී. ගාමිණි රූපසිංහ
18. පී. ජී. බී. ගාමිණී බණ්ඩාර
19. යූ. පී. කේ. කුමාර නවරත්න
20. ඒ. එම්. අයි. එල්. විජේරත්න

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජෙනරාල්.

2018 සැප්තැම්බර් මස 10 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

10-921

---

මගේ අංකය: IR/COM/03/2017/28.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

### 4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

වී. ජී. කැළුම් මයා, ඇලගාවත්ත, උඩරොට - මාමඩල, අම්බලන්තොට.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

මධ්‍යම සංස්කෘතික අරමුදල, අංක. 212/1, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවින්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්,

කටුගස්තොට, ගොහාගොඩ පාර, අංක 599, එච්. එම්. අනුලාවතී මෙනෙවිය පත් කර ඇය වෙත මෙයින් යොමු කරනු ලැබේ.

රවින්ද්‍ර සමරවීර,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2018 සැප්තැම්බර් මස 27 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/03/2017/28.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)

### 4(1) වන වගන්තිය යටතේ නියෝගය

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

වී. ජී. කැළුම් මයා, ඇලගාවත්ත, උඩරොට - මාමඩල, අම්බලන්තොට.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

මධ්‍යම සංස්කෘතික අරමුදල, අංක. 212/1, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

''මධ්‍යම සංස්කෘතික අරමුදලේ ආදේශක රියදුරකු ලෙස සේවය කරන වී. ජී. කැළුම් මහතාව රියදුරු තනතුරේ ස්ථිර නොකිරීම යුක්තිසහගතද? එසේ නොවන්නේ නම් එම සේවකයාට හිමි වියයුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.''

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 සැප්තැම්බර් මස 21 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

10-922

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.